# <u>12 ශ්‍රේණිය ආර්ථික විද්‍යාව - 6 වන සතිය - ජූනි 8 සිට 12 දක්වා</u>

නිපුණතාව 1 - ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න හා ඒවා විසඳා ගන්නා විකල්ප ක්‍රම තුලනාත්මකව විග්‍රහ කරයි.

නිපුණතා මට්ටම 1.1 - ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රය පරීක්ෂා කරයි.

- සමාජයේ ජීවත්වන මිනිසුන්ට විවිධ අවශ්‍යතා පවතින අතර ,මෙම අවශ්‍යතා භෞතික අවශ්‍යතා සහ මානසික අවශ්‍යතා ලෙස වර්ග කළ හැකිය.
- භාණ්ඩ හා සේවා පරිභෝජනය මගින් ඍජු ව සපුරා ගත හැකි අවශ්‍යතා භෞතික අවශ්‍යතා ලෙස හැඳින්වේ.

නිදසුන් - ආහාර,නිවාස,ඇඳුම්

- භාණ්ඩ හා සේවා පරිභෝජනයෙන් ඍජුව ම සපුරා ගත නොහැකි මානසික අවශ්‍යතා ද පවතී.
  නිදසුන් - ආධ්‍යාත්මික සංවර්ධනය,ආදරය,කරුණාව

- මිනිසුන් සමාජයේ පවතින සීමිත සම්පත් යොදා ගෙන භෞතික අවශ්‍යතා හා වුවමනා ඉටු කර ගැනීමට සිදු කරන ක්‍රියාකාරකම් හා හැසිරීම් ආර්ථික හැසිරීම් ලෙස හඳුන්වයි.
  නිදසුන් - භාණ්ඩ හා සේවා නිෂ්පාදනය,බෙදාහැරීම හා පරිභෝජනය

- සමාජයේ මිනිසුන්ගේ විවිධ හැසිරීම් පවතින අතර,මිනිසුන්ගේ ආර්ථික හැසිරීම් පිළිබඳ අධ්‍යයනය ආර්ථික විද්‍යාව තුළින් සිදු කෙරේ.
- ආර්ථික විද්‍යාවේදී අධ්‍යයනයට ලක්වන ආර්ථික පැතිකඩ යන්නෙන් අදහස් වන්නේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය,හුවමාරුව,පරිභෝජනය හා සම්බන්ධ මිනිස් හැසිරීමය.

## <u>සූක්ෂම ආර්ථික විද්‍යාව</u>

ආර්ථිකය සමන්විත වී ඇති එක් එක් අංශ,ආයතන,පුද්ගලයන් සහ ආර්ථික විචල්‍ය ආදී කුඩා ඒකක වෙන් වෙන් වශයෙන් ගෙන ඒවායේ හැසිරීම අධ්‍යයනය කිරීමයි.

උදා- ආයතනයක නිෂ්පාදන ශ්‍රිතය
    හිඟකම
    ආන්තික පිරිවැය

## <u>සාර්ව ආර්ථික විද්‍යාව</u>

ආර්ථිකයේ සමස්ත ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කිරීමයි.

උදා-සමස්ත නිමැවුම් මට්ටම
    ආයෝජනය
    ගෙවුම් ශේෂය

## <u>අභ්‍යාස</u>

1.ආර්ථික විද්‍යාව විද්‍යාවක් සේ හඳුන්වන්නේ ඇයි? පහදන්න.
2.ආර්ථික විද්‍යාව අනෙකුත් ස්වාභාවික විද්‍යාවන්ගෙන් වෙනස්වන ප්‍රධාන සාධක තුනක් දක්වන්න.
3.ආර්ථික විද්‍යාව පිළිබඳ ඔබ දන්නා නිර්වචනයක් ඉදිරිපත් කරන්න.
4.ආර්ථික විද්‍යාව ඉගෙනීමේ වැදගත්කම පිළිබඳ කරුණු පහක් දක්වන්න.